# LKAS 37 - ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ වත්කම්

## AAT අදියර II

## AFC - උසස් මූල්‍ය ගිණුම්කරණය හා පිරිවැයකරණය

අමිල සම්පත් මුදලිගේ
B.Sc. (Finance) USJ (UG), AAT Passed Finalist (Prize Winner), CASL (Finalist)

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

JMC vLearning
"your virtual learning partner"

# LKAS 37 ප්‍රතිපාදනයන්, අසම්භාව්‍ය බැරකම් සහ අසම්භාව්‍ය වත්කම්

Amila Sampath Mudalige
MAAT (Prize Winner)
B.SC (Finance ) USJ (UG)
CASL (Finalist)

## වගකීමක්

- අතීත සිදුවීමක ප්‍රතිඵලයක් සේ වර්තමානයේ පවතින බැඳීමක් වන අතර එය නිරාකරණය කිරීමට ව්‍යාපාරය සතු ආර්ථික සම්පත් පිටතට ගලායෑමක් සිදුවේ.




©JMC vLearning

# ප්‍රතිපාදන

- කාලය හෝ ප්‍රමාණය පිළිබඳ අවිනිශ්චිතතාවයක් සහිත වගකීමකි





©JMC vLearning

**බැඳීමක් ව්‍යාපාරයකට ප්‍රධාන ආකාර දෙකකට ඇතිවිය හැකිය.**

(i) නෛතික බැඳීමක් (Legal Obligation)

(ii) සම්මුතික බැඳීමක් (Constructive Obligation)




©JMC vLearning

JMC vLearning "your virtual learning partner"

## අසම්භාව්‍ය වගකීමක්

➢ අසම්භාව්‍ය බැරකම් පහත පරිදි නිර්වචනය කළ හැකිය.

**ආයතනයේ සම්පූර්ණ පාලනයකින් තොරව අවිනිශ්චිත අනාගත සිදුවීම් එකක් හෝ වැඩි ප්‍රමාණයක් සිදුවීම හෝ සිදු නොවීම මත ඇතිවිය හැකි අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස පැනනගින බැඳීමකි**

උදා: ව්‍යාපාරයට එරෙහිව අධිකරණය ඉදිරියේ ක්‍රියාත්මක වෙමින් පවතින නඩුවක් වෙනුවෙන් ගෙවියුතු වන්දියක්

හෝ

©JMC vLearning

**අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස ඇතිවන්නා වූ එහෙත්,**

**(අ) අදාළ බැඳීම පියවීම සඳහා ව්‍යාපාරයෙන් පිටතට සම්පත් ගලායාමේ භව්‍යතාවක් (සම්භාවිතාවක්) නොමැති වීම, හෝ**

**උදා: ආයතනයේ සේවකයන් රක්ෂණය කර ඇති අවස්ථාවක සේවක ආපදාවක් සඳහා වන්දියක් ගෙවිය යුතු විටක අදාල වන්දි මුදල රක්ෂණ ආයතනය ගෙවීම හේතුවෙන් ඒ සඳහා ආයතනයේ මුදල් ගලායාමක් සිදුනොවීම.**

**(ආ) බැඳීමේ වටිනාකම පැහැදිලි ලෙස තක්සේරු කළ නොහැකි වීම හේතුවෙන් මෙතෙක් නිශ්චිතව හඳුනා නොගන්නා ලද ප්‍රවර්තන බැඳීම්යි**

**උදා: ව්‍යාපාර අයතනයක අංශයක් වසා දැමීම ගෙවිය යුතු වන වන්දි**

©JMC vLearning

JMC vLearning "your virtual learning partner"

| | බැරකම් / වගකීම් | ප්‍රතිපාදනයන් | අසම්භාව්‍ය බැරකම් |
|---|---|---|---|
| (1) | අතීත සිදුවීමක ප්‍රතිඵලයක් සේ වර්තමානයේ ඇති බැඳීමකි. මෙම බැඳීම නිරවුල් කිරීමට ආර්ථික ප්‍රතිලාභ හා බැඳුණු සම්පත් ගෙවා දැමීමට සිදුවේ.<br>උදා: වෙළඳ ණයහිමියන්, උපචිතයන් | කාලය හෝ වටිනාකම පිළිබඳව විනිශ්චිතතාවයක් සහිත බැරකමකි. උදා: වෙළඳ ප්‍රතිශ්‍රධාහාර | පැවැත්ම තීරණය වන්නේ ව්‍යාපාරයේ පාලනයෙන් තොරව අනාගතයේදී සිදුවිය හැකි හෝ සිදුවිය නොහැකි සිදුවීම් එකක් හෝ කිහිපයක ප්‍රතිඵලයක් මතයි. හඳුනා ගැනීමේ කොන්දේසි සම්පූර්ණ නොවන බැරකම් ද මෙම ගණයට අයත්ය.<br>උදා: සේවක වන්දි ඉල්ලීම |
| (2) | ශේෂපත්‍රයේ බැරකම් සේ හඳුනා ගනී. | ශේෂපත්‍රයේ බැරකම් සේ වෙනමම හඳුනා ගනී. | බැරකම් වශයෙන් ශේෂපත්‍රයක හඳුනා නොගනී. |
| (3) | ගෙවිය යුතු ණය, ණයහිමියන් වැනි ශේෂ බැරකම් වන්නේ දැනටමත් අදාළ භාණ්ඩ හා සේවා ලබාගෙන ඒ සඳහා ඉන්වොයිස් නිකුත්කර ඇති නිසා ගෙවිය යුතු මුදල පිළිබඳ නිශ්චිත එකගත්වයක් පවතින හෙයිනි.<br>උපචිතයන්ද ඇස්තමේන්තු කළත් ප්‍රතිපාදනයන් තරම් අවිනිශ්චිතතාවක් ඒවායේ දක්නට නොලැබේ. | සාමාන්‍ය ව්‍යවහාරයේදී සියලුම ප්‍රතිපාදනයන්ගේ අසම්භාව්‍ය තත්ත්වයක් ඇතැයි හැගෙන්නේ ඒවායේ කාලය හා ප්‍රමාණය පිළිබඳ අවිනිශ්චිතතාවයක් පවතනි හෙයිනි. කෙසේ වුවද විචක්ෂණභාවය අනුව මෙම ප්‍රමිතියේ නිර්ණායකයන් සම්පූර්ණ වන විට ප්‍රතිපාදන ශේෂපත්‍රයක බැරකම් සේ හඳුනා ගනී. | අසම්භාව්‍ය බැරකම් ශේෂපත්‍රයක බැරකම් සේ හඳුනා නොගන්නේ:<br>• වර්තමානයේ බැඳීමක් ඇත්ද සහ එම බැඳීම නිරවුල් කිරීමට ආර්ථික ප්‍රතිලාභ හා බැඳුනු සම්පත් ගලායෑමක් සිදුවේද යන්න තාමත් තීරණය වී නොමැති හෙයින් හෝ,<br>• ප්‍රමිතියේ පරිදි වර්තමාන බැඳීමක් ඇත්ද යන්න හඳුනාගැනීමට අවශ්‍ය නිර්ණායකයන් සම්පූර්ණ නොවන හෙයිනි. |

©JMC vLearning

## අසම්භාව්‍ය වත්කම්

**අසම්භාව්‍ය වත්කම් යන්නෙන් අදහස් වන්නේ අතීත සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස ඇතිවන, ව්‍යාපාරයේ පාලනයකින් තොරව අනාගතයේ සිදුවිය හැකි යම් සිද්ධියක් හෝ සිදුවීම් කිහිපයක් සිදුවීම හෝ නොවීම මත පැවැත්ම තහවුරු කෙරෙන වත්කමිය.**




©JMC vLearning